මුසලි ප්‍රාදේශිය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය.

----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

-----------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 11 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 ජුනි 05 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

සභාපතිවරයා වෙත යවන ලද වාර්තවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති මුසලි ප්‍රාදේශිය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මට මතයක් ප්‍රකාශ කළ නොහැක.

1.3 ගිණුම් පිළිබඳ අදහස් දැක්විම

--------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

නිරික්ෂණය වූ මූල්‍ය ප්‍රකාශන වල ගිනුම්කරණ අඩුපාඩු පහත ප්‍රකාශයන්හි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන්හි කෙරෙහි බලපෑම | වත්කම් | | වියදම් | |
|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| වැඩියෙන් දැක්විම් | 02 | 3,792,296 | 01 | 427,392 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

---------------------------------------------

එකතුව රු.6,556,838 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා අවශ්‍ය වූ තොරතුරු විගණනයට ලබා නොදීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

-----------------

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988 පරිච්ඡේදය IX හි රීති 180 ප්‍රකාරව මුදල් හා ගබඩා භාරව සිටින නිලධාරීන් විසින් ඇප තබා නොතිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988 පරිච්ඡේදය III හි රීති 81 ප්‍රකාරව සෑම වර්ෂයකම එක් එක් කාර්තුව අවසානයේදී මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ලබා ගැනිම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988 පරිච්ඡේදය VII හි රීති 166 ප්‍රකාරව පොදු ලෙජරයේ සටහන් තැබීම සඳහා ජ'නලයක් පවත්වාගෙන ගොස් නොතිබුණි

1.3.4 ලැබිය යුතු ගිණුම්

----------------------

1988 වර්ෂයේ සිට 2011 වැනි දීර්ඝ කාලයක් තුල අයවිමට තිබූ රු.533,031 ක අත්තිකාරම් බේරුම් කිරිමට කටයුතු කර නොතිබුණි.

1.3.5 බේරුම් නොකළ අත්තිකාරම්

--------------------------------

වාහනයක් අළුත්වැඩියා කිරිම සඳහා නිලධාරියෙකුට ගෙවා තිබූ රු.100,000 අත්තිකාරමක් බේරුම් කර නොතිබූ අතර එය ගිණුම් පොත්වල සටහන් කිරිම ද සිදුකොට නොතිබුණි.

1.3.6 කල් ඉකුත් වූ තැන්පතු

-----------------------

(අ) අනෙකුත් තැන්පතු හැර ආදායම් තැන්පතු පමණක් තැන්පතු ලේඛණයේ සටහන් කර තිබූ බැව් නිරික්ෂනය විය.

(ආ) කල් ඉකුත් වූ රු.23,000 ක තැන්පතු මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

1.3.7 කාර්ය මණ්ඩල ණය අයකර ගැනිම

--------------------------------------

එකතුව රු.45,794 ක් වූ කාර්ය මණ්ඩල හිඟ ණය ශේෂ අයකර ගැනිම සඳහා කටයුතු කර නොතිබුණි.

1.3.8 පොත්පත් හා ලෙජර පවත්වා ගෙන නොයෑම.

------------------------------------------------------

(අ) ප්‍රධාන ලෙජරය විධිමත්ව පවත්වා ගෙන ගොස් නොතිබුණි.

(ආ) ශේෂ පිරික්සුම අනුව වාහනයක පිරිවැය රු.43,975,000 ක් වූ අතර ලෙජර් අනුව එහි අගය රු.32,856,568 ක් විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන වලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.13,190,818 ක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,916,760 ක් විය.

2.2 මූල්‍ය කළමනාකරණය

-----------------------------

අයවැයගත සංඛ්‍යාව සහ තත්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය යථාර්ත පදනමක් මත පිළියෙල කර නොමැති බැව් නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ ආදායම් සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම, තත්‍ය ආදායම සහ හිඟ හිටි ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | අයවැයගත | තත්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟහිටි ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ( i) බදු කුලි | 2,000,000 | 1,562,670 | - |
| (ii) බලපත්‍ර ගාස්තු | 310,000 | 940,550 | - |
| (iii) වෙනත් ආදායම් | 10,717,000 | 8,653,474 | 171,344 |

2.4 වත්කම් කළමනාකරණය

------------------------------

නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------

ප්‍රාදේශිය සභාවට අයත් පහත සඳහන් වත්කම් නිෂ්ක්‍රියව පැවතුණි.

| | වාහන අංකය | වාහන වර්ගය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| | --------------- | --------------- | ---------------- |
| (i) | RB 9077 | ට්‍රැක්ටර් | අවුරුදු 02 |
| (ii) | 3191 | ගොයම් කැපීමෙ යන්ත්‍රය | අවුරුදු 02 |
| (iii) | | කොන්ක්‍රීට් මිශ්‍රණය | අවුරුදු 02 |

2.5 මතභේදයට තුඩුදෙන ස්වරූපයේ ගනුදෙනු

---------------------------------------------

එක්තරා සමාගමකින් රු.850,000 ක් ගෙවා ට්‍රැක්ටරයක් මිලට ගෙන තිබූ අතර අදාල ගෙවීම සිදුකර තිබුණේ පෞද්ගලික පුද්ගලයෙකු නමින්ය.

2.6 අභ්‍යන්තර විගණනය

----------------------------

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) මානව සම්පත් කළමනාකරණය
(ඉ) පරිත්‍යාග
(ඊ) වාහන උපයෝජනය
(උ) මිශ්‍ර තැන්පතු
(ඌ) අයවැය